**සේරුවිල ප්‍රාදේශීය සභාව - 2022**

**------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

සේරුවිල ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට සේරුවිල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂයපථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන

තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂයපථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගැයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලැසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිති,රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාතර්ාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) ප්‍රාදේශීය සභාවේ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේ දී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිදේර්ශය |
|---|---|---|---|
| (අ) | LDSP ව්‍යාපෘතිය යටතේ වූ PT(I) ව්‍යාපෘතිය සඳහා 2021 වර්ෂයට අදාළව ලැබී තිබුණු රු.1,850,163 ක මුදල සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන ආදායමක් ලෙස ගලපා තිබුණි. | පිළිගන්නා බව සහ මෙවැනි තත්වයන් ඇති නොවන ආකාරයට කාලච්ඡේදයට අදාල ගණුදෙනු නිවැරදිව සටහන් කර ගන්නා බව. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කළ යුතුය. |
| (ආ) | 2020 හා 2021 වර්ෂ වෙනුවෙන් පිළිවෙලින් රු.45,900 ක් හා රු.49,200 ක විගණන ගාස්තු සඳහා ගිණුම්වල ප්‍රතිපාදන සලසා නොතිබුණි. | ඉදිරියේදී නිවැරදිව ගිණුම් සකස් කරන බව. | -එම- |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රයේ දක්වා තිබූ මහජන බැංකුවේ ජංගම ගිණුමේ පැවති ආරම්භක හා අවසන් ශේෂ පිළිවෙලින් රු.888,448 හා රු.1,529,948 ක මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කිරීමේදී ගළපා නොතිබුණි. | මුදල් ප්‍රවාහ ප්‍රකාශ සකස් කිරීමේදී අතපසුවීමකින් අදාල ශේෂයන් මග හැරී ඇති බව. | -එම- |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ අතිරික්තය රු.4,964,815 ක් ප්‍රාග්ධන යෙදවුමට ආදායමින් දායක වීමේ ගිණුමට බැර කර තිබුණි. | ඉදිරිවර්ෂයේදී ගිණුම් සකස් කරන විට මෙය ජ'නල් සටහනක් මගින් නිවැරදි කරන බව. | -එම- |
| (ඉ) | 2021 ජනවාරි සිට ජූනි දක්වා කාලය සඳහා ලැබුණු රු.570,832 ක මුද්දර ගාස්තුව සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | -එම- | -එම- |
| (ඊ) | 2021 ජුලි සිට දෙසැම්බර් දක්වා වූ කාලය සඳහා අය විය යුතු රු.413,800 ක් හා 2022 වර්ෂය සඳහා අයවිය යුතු හිඟ මුද්දර ගාස්තු ගිණුම්ගත කර නොතිබුණි. | -එම- | -එම- |
| (උ) | සමාලෝචිත වර්ෂය සඳහා ලැබිය යුතු ස්ථාවර තැන්පත් පොළී ආදායම රු.9,346,913 ක් අඩුවෙන් ගිණුම් ගතකර තිබුණි. | මෙ පිළිබඳව සේරුනුවර මහජන බැංකුවෙන් අළුත්කිරීමේ නිවේදන ලබා ගනිමින් නිවැරදි පොලිය | -එම- |

| | | | |
|---|---|---|---|
| | | ගණනය කර අදාල ප්‍රමාණය නිවැරදිව ගිණුම් ගත කරන බව. | |
| (ඍ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.1,647,961 ක් වූ ලැබිය යුතු වැටුප් ප්‍රතිපූර්ණය හා සහික දීමනාවල අගය ගිණුම් ගතකර නොතිබුණි. | අතපසුවීමකින් මගහැරී ඇති බව සහ ලබන වසරෙහි නිවැරදි කරන බව. | -එම- |
| (එ) | පෙර වර්ෂයේ දෙසැම්බර් මස වැටුප් ප්‍රතිපූර්ණය හා සහික දීමනා මුදල රු.1,412,520 ප්‍රවර්ථන වර්ෂයේ ලැබීමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | -එම- | -එම- |

## 1.6.2 නොසැසඳුනු පාලන ගිණුම්

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගිණුම් ශේෂ 04 ක සහ එකතුව සහ ඊට අනුරූපී ලේඛනවල එකතුන් අතර රු.28,775 ක වෙනසක් විය. | පිළිතුරු ලබා දී නැත. | ලේඛන නිසි පරිදි පවත්වා ගත යුතුය. |

## 1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.145,058,911 ක් වටිනා ගිණුම් ශේෂ 05 ක් අයිතිය තහවුරු කිරීමේ ලියවිලි, යාවත්කාලීන කළ ස්ථාවර තැන්පතු සහතික සහ තොග ආගණන වාර්තා ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කළ නොහැකි විය. | ඉදිරියේදී නිවැරදි කරන බව. | ගිණුම් විෂයයන්ට අදාළ නිවැරදි තොරතුරු ඉදිරිපත් කළ යුතුය. |

## 1.7 අනුකූල නොවීම්

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති. රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත | | | |
| (i) | 24 වගන්තිය | සභාව විසින් ඉදිකිරීම් කරන ලද මාර්ග ඉන්වෙන්ට්‍රිගත කර තිබුණ අතර එම මාර්ග සියල්ල ගැසට් කිරීමටද කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී මාර්ග ගැසට් කිරීම සඳහා අවශ්‍ය කටයුතු කරන බව. | පවත්නා සියලු මාර්ග ඉන්වෙන්ට්‍රිගත කර ගැසට් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ii) | 134 වගන්තිය | සභාවේ බල ප්‍රදේශය තුළ පිහිටි දියුණු ප්‍රදේශ හඳුනාගෙන වරිපනම් හා බදු පැනවීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී වරිපනම් බදු ගැසට් කිරීම සඳහා අවශ්‍ය කටයුතු කරන බව. | ප්‍රාදේශීය සභා පනතේ 134 වගන්තිය අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | | | |
| (i) | 143 වැනි රීතිය | රු.6,564,471 ක් වූ ආපසු ගෙවිය යුතු තැන්පතු සඳහා වර්ගීකරණය කර ඊට අනුව ගිණුම් තබා නොතිබුණි. | ඉදිරියේදී නියමිත පරිදි වර්ගීකරණය කර නිවැරදිව ගිණුම්ගත කිරීමට අවශ්‍ය පියවර ගන්නා බව. | ප්‍රාදේශීය සභා රීති අනුව කටයුතු කළ යුතුය. |
| (ii) | 218 වැනි රීතිය | පිරිවැය රු.122,078,290 ක් වූ ඉඩම් හා ගොඩනැගිලි සෑම වර්ෂයකට වරක් සමීක්ෂණය කර නොතිබුණි. | ඉදිරියේදී අදාල පරිදි කටයුතු කිරීමට පියවර ගන්නා බව. | ප්‍රාදේශීය සභා රීති අනුව කටයුතු කළ යුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 1645 සහ 1646 | වාහන 08 ක ධාවන සටහන් හා මාසික සාරාංශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | ඉදිරියේදී අවශ්‍ය පරිදි කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 2,803,721 ක් වූ අතර,ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන ආදායම ඉක්ම වූ වියදම රු. 4,561,496 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තත්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ඇස්තමේන්තුගත ආදායම් රු.000 | බිල්කළ ආදායම් රු.000 | රැස්කළ ආදායම් රු.000 | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය රු.000 | ඇස්තමේන්තුගත ආදායම් රු.000 | බිල්කළ ආදායම් රු.000 | රැස්කළ ආදායම් රු.000 | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය රු.000 |
| කුලී | 5,346 | 3,819 | 2,956 | 2,064 | 5,231 | 1,015 | 1,015 | 1,161 |
| බලපත්‍ර ගාස්තු | 695 | 706 | 706 | - | 645 | 494 | 494 | - |
| වෙනත් ආදායම් | 14,163 | 12,757 | 11,041 | 1,716 | 13,603 | 10,420 | 7,177 | 3,243 |
| එකතුව | 20,204 | 17,282 | 14,703 | 3,780 | 19,479 | 11,929 | 8,686 | 4,404 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිදේශය |
|---|---|---|
| 2022 දෙසැම්බර් 31 දිනට රු.863,333 ක හිඟ කුලී ආදායමක් පැවති අතර එයින් 2011 සිට 2020 අතර කාල පරාසයකට අයත් හිඟහිටි කුලී ආදායම රු.1,150,031 ක් විය. | අදාල හිග කුලී මුදල් අයකර ගැනීම සඳහා අවශ්‍ය පියවර ගන්නා බව. | හිඟ මුදල් අයකර ගැනීමට විධිමත් වැඩපිළිවෙලක් සකස් කර හිඟ මුදල් කඩිනමින් අය කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිදේශය |
|---|---|---|
| පරිත්‍යාග ලෙස ලැබුණු ස්ථාවර වත්කම් 09 ක වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | තක්සේරු කර ගිණුම්ගත කළ යුතුය. |

### 3.2 නිශ්කාර්ය හෝ ඌණ උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිදේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රාදේශීය සභාවට අයත් රු.9,223,824 ක් වටිනා වාහන 11 ක් අක්‍රීයව පවතින අතර එම වාහන සඳහා සුදුසු ක්‍රියාමාර්ගයන් ගෙන නොතිබුණි. | වාහන අළුත්වැඩියාව සඳහා ප්‍රමාණවත් අරමුදල් සභාව සතුව නොමැති බව සහ ඉදිරියේදී අවශ්‍ය කටයුතු කරන බව. | කඩිනමින් අළුත්වැඩියා කිරීම කෙරෙහි හෝ සුදුසු ක්‍රියාමාර්ග ගැනීම කෙරෙහි අවධානය යොමු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ප්‍රාදේශීය සභාව විසින් 2014 වර්ෂයේදී සභා අරමුදලින් රු.938,000 ක් වැයකර දැන්වීම් ප්‍රචාරය සඳහා සවිකළ LED දැන්වීම් පුවරුව 2014 මාර්තු 14 දින සිට අක්‍රියව පැවති අතර සමාලෝචිත වර්ෂයේදී එය අළුත්වැඩියා කොට භාවිතයට ගෙන නොතිබුණි. | අදාල තිරය අළුත්වැඩියා කර ගැනීමට අවශ්‍ය කටයුතු පිළිබදව අවධානය යොමු කරන බව. | කඩිනමින් අළුත්වැඩියා කර භාවිතයට ගැනීම කළ යුතුය. |
| (ඇ) | ප්‍රාදේශීය සභාව විසින් 2014 වර්ෂයේදී රු.19,000,000 ක පිරිවැයක් දරා ඉදිකළ ආදාහනාගාරය සමාලෝචිත වර්ෂය තුළ කිසිදු භාවිතයක් නොමැතිව පැවතුණි. | මේ පිළිබදව අවධානය යොමු කර ඉහළ නිලධාරීන්ගේ උපදෙස් ලබා ගනිමින් අවශ්‍ය කටයුතු කරන බව. | කඩිනමින් ප්‍රයෝජනයට ගත හැකි වන පරිදි ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඈ) | රු.7,191,123 ක පිරිවැයක් දරා ඉදිකළ සේරුවිල නගර ශාලාව ප්‍රමාණවත් ආදායමක් ලැබෙන පරිදි උපාය මාර්ග අනුගමනය නොකිරීම නිසා සමාලෝචිත වර්ෂය තුළදීද රු.3,000 ක ආදායමක් පමණක් උපයාගෙන තිබුණි. | සේරුනුවර නගර ශාලාව කුලියට දීම තුලින් 2023 මාර් තු 20 දින වන විට 2023 වර්ෂයට අදාලව රු. 31500 ක මුදලක් අයකර ගෙන ඇත් අතර ඉදිරියේදී මෙම අදායම ඉහල නංවා ගැනීමට අවශ්‍ය පියවර ගන්නා බව. | විධිමත්ව සැලසුම් කර ආදායම් උත්පාදනය කිරීමට ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඉ) | 2021 ඔක්තෝබර් 12 දින සභාව විසින් මිලදී ගත් රු.485,500 ක් වටිනා අමුද්‍රව්‍ය ඇඹරුම් යන්ත්‍රය ඌණ උපයෝජනයෙන් යුක්තව පැවතුණි. | අමුද්‍රව්‍ය ඇඹරුම් යන්ත්‍රය මෙම වර්ෂයේදී භාවිතා කිරීමට අවශ්‍ය පියවර ගන්නා බව. | කඩිනමින් ප්‍රයෝජනයට ගත යුතුය. |

## 3.3 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|
| සේරුවිල ප්‍රාදේශීය සභාවට ලැබුණු හා සභාව විසින් දැනටමත් භාවිත කරනු ලබන රු.41,388,101 ක් වටිනා වාහන 13 ක් විගණිත දිනය වන විටද පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | මේ සඳහා අවශ්‍ය කටයුතු ඉදිරියේදී කරන බව. | කඩිනමින් පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.4 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිදේර්ශය |
| --- | --- | --- |
| සභාවේ අනුමත සේවක මණ්ඩලය හා සත්‍ය සේවක සංඛ්‍යාව සැසඳීමේදී තනතුරු 10 ක පුරප්පාඩු 13 ක් පැවතුණි. | අනුමත සේවක සංඛ්‍යාවෙහි පවතින පුරප්පාඩු සම්පූර්ණ කරදෙන ලෙස අදාල බලධාරීන්ගෙන් ලිඛිතව ඉල්ලීම් කර ඇති බව. | පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිදේර්ශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව අභ්‍යන්තර විගණක විසින් ඉටු කළ යුතු කාර්යයන් 21 ක් හඳුනාගෙන තිබුණද එම කාර්යයන් ඉටු කළ බවට සාක්ෂි නොවීය. | මේ සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණක ලිඛිතව හා වාචිකව දැනුවත් කර ඇත. ඉදිරියේදී අවශ්‍ය පරිදි කටයුතු කිරීමට උපදෙස් ලබා දෙන බව. | අභ්‍යන්තර විගණනය විධිමත් කළ යුතුය. |

### 4.2 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිදේර්ශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු අයවැය ලේඛණයට අනුව ඇස්තමේන්තුගත ආදායම් හා වියදම් තථ්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේදී ආදායම් විෂයයන් 05 ක සියයට 28.41 සිට සියයට 487.54 දක්වා ද වියදම් විෂයයන් 04 ක සියයට 10.74 සිට සියයට 82.31 ක් දක්වාද විචලනයන් නිරීක්ෂණය වූ බැවින් අයවැය ලේඛණය ඵලදායී පාලන කාරකයක් වශයෙන් යොදාගෙන නොතිබූ බව නිරීක්ෂණය විය. | අයවැය ලේඛණය ඵලදායී පාලන කාරකයක් වශයෙන් යොදාගෙන කටයුතු කිරීමට අවධානය යොමු කරන බව. | අයවැය ලේඛනය විධිමත් කළ යුතුය. |

### 4.3 පාරිසරික ගැටලු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිදේර්ශය |
| --- | --- | --- |
| 1980 අංක 47 දරන ජාතික පරිසර පනතට සිදුකළ සංශෝධන ප්‍රකාරව, එකතු කරන ලද කසල වර්ගීකරණය නොකර රැස්කිරීම, ඒවා නිදහසේ මුදා හැරීම, ප්‍රතිචක්‍රීයකරණ ක්‍රියාවලිය අඛණ්ඩව සිදු නොකිරීම, බල ප්‍රදේශයට සරිලන බැහැර | මේ පිළිබඳව අවධානය යොමු කර කටයුතු කරන බව. | පාරිසරික ගැටළු අවම කිරීම කෙරෙහි අවධානය යොමු කළ යුතුය. |

කිරීමේ ක්‍රමවේදයක් අනුගමනය නොකිරීම වැනි හේතූන් මත වනසතුන් විසින් කැලිකසල පරිභෝජනය කිරීම හා නොදිරන කසල ප්‍රදේශය පුරා විසිරී පැවතුණි.

## 4.4 තිරසර සංවධර්න අරමුණු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිදේශය |
| --- | --- | --- |
| සභාව විසින් 2017 අංක 19 දරන තිරසාර සංවර්ධන පනතේ ඇතුළත් තිරසාර සංවර්ධන අරමුණු, ඉලක්ක හා අදාළ නිර්ණායක හඳුනාගෙන තිබුණ අතර සමාලෝචිත වර්ෂය තුළ ළඟා කර ගත යුතු කාර්ය සාධන දර්ශක 04 ක් අත්පත් කර ගැනීමට ක්‍රියාමාර්ග ගෙන තිබුණි. | පිළිතුරු ලබාදී නොමැත. | 2030 වන විට අත්පත් කළ යුතු තිරසාර සංවර්ධන අරමුණු හඳුනා ගැනීම හා අත්පත් කර ගැනීම කෙරෙහි අවධානය යොමු කළ යුතුය. |